**අතුරලිය ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අතුරලිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු භෞතිකව නොතිබූ රු. 272,100 ක් වටිනා අත් ට්‍රැක්ටරයක් හා පා පැදියක් මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා අවස්ථා දෙකකදී ප්‍රතිපාදන සැලැස්වීම නිසා විගණන ගාස්තු සඳහා රු.200,000කින් ණයහිමි ප්‍රතිපාදන වැඩිපුර දක්වා තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,444,155 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ඉකුත් වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් 02 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.138,610 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.10,839,361 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.733,304ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අවිධිමත් ලෙස පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.113,880ක කුලියක් සභාවට අයවීමට තිබුණි. | ඉදිරියේදී රඳවුම් මුදලින් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

මුදල් රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මු.රෙ. 272(1) හා (2) | සභාව සතු ජංගම ගිණුමෙන් ගෙවන ලද රු.51,072 ක් වටිනා වවුචර් දෙකක් අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම වවුචර්පත් දෙක කඩිනමින් සොයා ඉදිරිපත් කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | මු.රෙ. 571 | වසර 02 කට වඩා කල් ඉකුත් වූ රු.3,318,945 ක් වටිනා තැන්පතු ශේෂ 142 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පවත්වන මුදල් කමිටුවට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගනිමින් කටයුතු කිරීමට වවුචර් සකස් කර ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | අංක 01/2021 හා 2021 සැප්තැම්බර් 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2:3(iv) ඡේදය | තලහගම බටහිර ශ්‍රමදාන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සඳහා එක්තරා ග්‍රාම සංවර්ධන සමිතියකට රු.1,468,365 ක ගිවිසුම්ගත මුදලකට පවරා තිබුණද කොන්ත්‍රාත්තුව ඉටුකිරීම පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙක් විසින් සිදුකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.196,720 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 315,020 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,262,500 | 1,392,865 | 1,455,502 | 1,671,954 | 1,835,000 | 626,573 | 492,058 | 1,734,591 |
| (ii) | කුලී | 3,854,000 | 5,973,359 | 4,998,780 | 1,385,086 | 3,635,000 | 841,250 | 565,505 | 410,507 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 317,000 | 308,140 | 275,840 | 262,650 | 193,500 | 662,510 | 491,610 | 230,350 |
| (iv) | වෙනත් ආදායම් | 1,140,000 | 1,342,725 | 1,065,895 | 322,799 | 984,500 | 609,347 | 600,023 | 45,969 |
| | | 7,573,500 | 9,017,089 | 7,796,017 | 3,642,489 | 6,648,000 | 2,739,680 | 2,149,196 | 2,421,417 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යයසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබූ හිඟ වරිපනම් බදු ශේෂය රු.1,734,591 ක් වූ අතර, වර්ෂය අවසානයට එම ශේෂය රු.1,544,012 ක් විය. | වරිපනම් බදු අය කර ගැනීම සඳහා සෑම සතියකම හිඟ අය කර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු කඩ කුලී අයවන කඩ කාමර 23 ක් පැවති අතර ඉන් කඩ කාමර 07 කින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 297,898 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් ලබා ගැනීම සඳහා දැනුවත් කිරීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු උසාවි දඩ රු.425,869 ක් හා මුද්දර ගාස්තු රු.12,280,425 ක් විය. | අයවිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ එක්රැස් වන දිරාපත් වන කසළ භාවිතා කර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමටත් නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමත් සඳහා ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ වෙනුවට දෛනිකව එක්රැස් කරන දිරාපත් වන කසළ අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් නිෂ්පාදන අංගනය වෙත ලබාදීමත් නොදිරන කසළ ගොඩපිටිය රඝීනාවත්ත නමැති පෞද්ගලික ඉඩමකට බැහැර කරන බවත් නිරීක්ෂණය විය. | ප්‍රතිචක්‍රීකරණය කල හැකි නොදිරන ද්‍රව්‍ය මාතර මහ නගර සභාව වෙත ලබා දීමටත්, ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය බිම් පිරවුම් ලෙස පුද්ගලික ඉඩමකට ලබාදීමත් සිදු කරන බව. | විධිමත් ලෙස කසළ බැහැර කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති පරිදි සංශෝධිත පුරවැසි ප්‍රඥප්තිය පිළියෙල කර සභාවේ ප්‍රදර්ශනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී එය සකස් කර මහජන ප්‍රදර්ශනයට තැබීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි යාවත්කාලීනව තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් වල වටිනාකම නැවත තක්සේරු කර ගිණුමට නව වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සභාව සතු සභාව විසින් නඩත්තු කරන සියලුම මාර්ග ඇතුළත් කර මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් සකස් කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කිරීම පරිගණක මෘදුකාංගය මගින් සිදු කරන බව. | මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් සකස් කළ යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PR/01/01 හා 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව වීථි ලාම්පු ස්ථාපනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වීථි පහන් නඩත්තු කටයුතු සඳහා දරන ලද රු.470,000 ක වියදම ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වීථි පහන් නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය නොකරන බවට විදුලිබල මණ්ඩලය විසින් ලිඛිතව දන්වා ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තලහගම බටහිර ක්‍රීඩාංගනය ඉදිකිරීමේදී පස් කැපීම යන්ත්‍රානුසාරයෙන් සිදු කර, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා ඝන මීටරයකට MS -034 යටතේ හඳුන්වා දී තිබූ රු.766.04 රේටය භාවිතා කිරීම නිසා කොන්ත්‍රාත්කාර සමිතියට රු.484,648 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව. | වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගතයුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 05 දෙනෙකු, සෞඛ්‍ය කම්කරුවෙකු හා පුස්තකාල සහායකයෙකු වෙත තනතුරට අදාල නියමිත රාජකාරි පැවරීමකින් තොරව රාජකාරි පවරා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.2,590,380 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. | ආයතනයේ සේවා අවශ්‍යතාවය අනුව රාජකාරී පැවරීම සිදු කරනු ලබන බව. | තනතුරුවලට අදාළ රාජකාරි පැවරිය යුතු වේ. |